සැ. යු. - (i) 2021.06.18 වැනි දින අංක 2233 දරන ගැසට් පත්‍රයේ I : III, II, III සහ IV(ආ) කොටස් පළ නොවීය.

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අංක 2,234 - 2021 ජූනි මස 25 වැනි සිකුරාදා - 2021.06.25

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

## I වැනි කොටස : (IIආ) වැනි ඡේදය - පළකිරීම්

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත)

| | පිටුව |
|---|---|
| ටෙන්ඩර් කැඳවීමේ දැන්වීම් .... ... ... | — |
| තීරණය කළ ටෙන්ඩර් පත් පිළිබඳ දැන්වීම් ... ... ... | — |
| බඩු බාහිරාදිය විකිණීම් ... ... ... | — |
| තොටුපල් රේන්ද හා වෙනත් රේන්ද විකිණීම් ... ... ... | — |
| රජයේ නොවන දැන්වීම් ... ... ... | 1398 |
| රට බීම විකිණීමේ බලපත්‍රය සඳහා වූ අයදුම්පත් ... ... | — |
| වෙන්දේසි කිරීම් පිළිබඳ දැන්වීම් ... ... ... | — |

**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

### වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයක ම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළකිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි *ගැසට් පත්‍රය* පළ වූ දින සිට **තෙමසකට** පසුව භාරගනු නොලැබේ.

*ගැසට් පත්‍රයේ* පළකරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනට සති දෙකකට පෙර (එනම්, 2021 ජූලි මස 16 වැනි දින පළ කෙරෙන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2021 ජූලි මස 02 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර) තැපෑලෙන් හෝ ගෙනැවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

**2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගණුදෙනු පනත - 9 වැනි වගන්තිය**

*" යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් ගැසට් පත්‍රයේ පළකළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය, අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන ගැසට් පත්‍රයක පළකරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණකර ඇත්තාක් සේ සැලකිය යුතුය."*

**ගංගානි ලියනගේ,**
රජයේ මුද්‍රණාලයාධිපති.

2021 ජනවාරි මස 01 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

*මෙම ගැසට් පත්‍රය www. documents.gov. lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

# රජයේ නොවන දැන්වීම්

## වැලිබල් ෆිනෑන්ස් පීඑල්සී

(ලියාපදිංචි අංකය පීබී 26පීක්‍යු) අංක 310

ගාලු පාර, කොළඹ 03.

2007 අංක 07 දරන සමාගම් පනතේ 127 වගන්තිය ප්‍රකාරව වැලිබල් ෆිනෑන්ස් පීඑල්සී සමාගමෙහි කොටස් ලේඛනය, 2021 ජූලි මස 01 වැනි බ්‍රහස්පතින්ද දින සිට 2021 ජූලි මස 05 වැනි සඳුදා දින වන තෙක් (එම දින දෙක ද ඇතුලුව) වසා තැබීමට නියමත බව අප විසින් මෙලෙස නිවේදනය කර සිටිමු.

වැලිබල් ෆිනෑන්ස් පීඑල්සී,
සමාගමෙහි අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

පී ඩබ්ලිව් කෝපරේට් සෙක්‍රටේරියල් (පීවීටී) එල්ටීඩී,
සමාගම් ලේකම්වරුන්.

06-351

---

## සමාගමේ නාමය වෙනස් කිරීම

2007 අංක 07 දරන සමාගම් පනතේ 9 (2) වගන්තිය ප්‍රකාර මෙහි පහත සඳහන් සමාගමේ නාමය 2017 මාර්තු මස 03 වැනි දින සිට ක්‍රියාත්මක වනසේ වෙනස් කර ඇති බම මෙයින් දන්වා සිටිමු.

1. පෙර නාමය : එම්. ඊ. එච්. ඉන්ඩස්ට්‍රීස් (පුද්.) සමාගම, M. E. H. INDUSTRIES (PRIVATE) LIMITED
2. ලියාපදිංචි අංකය : පීවී 361
3. ලියාපදිංචි කාර්යාලය : අංක 36A, හේමාස් ගොඩනැගිල්ල, බිම් මහල, බ්‍රිස්ටල් වීදිය, කොළඹ 01.
4. නව නාමය: Esufally Tea (Private) Limited

අධ්‍යක්ෂ.

06-382

---

## ව්‍යාපාර නාමය වෙනස් කිරීම

2007 අංක 07 දරන සමාගම් ආඥාපනතේ අංක 9 (2) දරන වගන්තිය ප්‍රකාර පහත නම් සඳහන් සමාගමේ නාමය වෙනස් කර ඇති බව මෙයින් දන්වා සිටිමු.

මුලින් හැඳින් වූ නාමය : එසුෆලි තේ (පුද්ගලික) සමාගම
ලියාපදිංචි අංකය : PV 361
ලියාපදිංචි කාර්යාලය : අංක 36A, හේමාස් ගොඩනැගිල්ල, බිම් මහල, බ්‍රිස්ටල් වීදිය, කොළඹ 01
නව නාමය : එම්. ඊ. එච්. ඉන්ඩස්ට්‍රීස් (පුද්ගලික) සමාගම.

06-383

## ඒකාබද්ධ කිරීමයි

### 2007 අංක 7 දරන සමාගම් පනතේ 242 (3) (බී) වගන්තිය ප්‍රකාරව ෆේවරිට් ඉන්ඩස්ට්‍රීස් (ප්‍රයිවට්) ලිමිටඩ් (සමාගම් ලියාපදිංචි කිරීමේ අංක පී වී 3209) FAVOURITE INDUSTRIES (PRIVATE) LIMITED (PV 3209) සහ ෆේවරිට් ගාමන්ට්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් (සමාගම් ලියාපදිංචි කිරීමේ අංක පීවී 4087) FAVOURITE GARMENTS (PRIVATE) LIMITED (PV 4087) ඒකාබද්ධ කිරීම

2007 අංක 7 දරන සමාගම් පනතේ 242 (1) වගන්තිය ප්‍රකාරව ෆේවරිට් ඉන්ඩස්ට්‍රීස් (ප්‍රයිවට්) ලිමිටඩ් (සමාගම් ලියාපදිංචි කිරීමේ අංක පීවී 3209) සහ ෆේවරිට් ගාමන්ට්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් (සමාගම් ලියාපදිංචි කිරීමේ අංක පීවී 4087) යන සමාගම් ඒකාබද්ධ කිරීම පිණිස එකී ෆේවරිට් ඉන්ඩස්ට්‍රීස් (ප්‍රයිවට්) ලිමිටඩ් සහ ෆේවරිට් ගාමන්ට්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් සමාගම්වල අධ්‍යක්ෂ මණ්ඩල විසින් යෝජනා සම්මතයන් සම්මත කොට ඇති අතර,

එකී ඒකාබද්ධ කිරීමට අනුව ෆේවරිට් ඉන්ඩස්ට්‍රීස් (ප්‍රයිවට්) ලිමිටඩ් සහ ෆේවරිට් ගාමන්ට්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් යන සමාගම් දෙක ෆේවරිට් ගාමන්ට්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් නමින් එක් අස්ථිත්වයක් බවට ඒකාබද්ධ කරනු ලබන අතර, 2021 අගෝස්තු මස 01 දින සිට හෝ සමාගම් රෙජිස්ට්‍රාර්වරයා විසින් තීරණය කරනු ලබන දිනයක සිට ක්‍රියාත්මක වනු ඇත.

ෆේවරිට් ඉන්ඩස්ට්‍රීස් (ප්‍රයිවට්) ලිමිටඩ් සහ ෆේවරිට් ගාමන්ට්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් යන සමාගම් දෙකෙහි අධ්‍යක්ෂ මණ්ඩල විසින් 2007 අංක 7 දරන සමාගම් පනතේ 242 (4) වගන්තිය ප්‍රකාරව ඒකාබද්ධ කරනු ලබන සමාගමක කොටස් හිමියකු හෝ ණය හිමියකු හෝ සමාගමෙන් බැඳීමකට යටත් වී ඇති යම් තැනැත්තකු හට සාමාන්‍ය ව්‍යාපාර කටයුතු කරන වේලාවන්හි දී පරීක්ෂා කර බැලීම සඳහා ෆේවරිට් ඉන්ඩස්ට්‍රීස් (ප්‍රයිවට්) ලිමිටඩ් සහ ෆේවරිට් ගාමන්ට්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් යන සමාගම්වල අධ්‍යක්ෂ මණ්ඩල විසින් පිළිගන්නා ලද ඒකාබද්ධ කිරීමේ යෝජනාවේ පිටපත් කොළඹ 03, ගාලුපාර, අංක 385 (6 වැනි මහල) ද ලෑන්ඩ්මාක් දරන ස්ථානයේ පිහිටි සමාගමේ ලියාපදිංචි කාර්යාලයෙන් ලබාගත හැක.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

සමාගම් ලේකම්,
ෆේවරිට් ඉන්ඩස්ට්‍රීස් (ප්‍රයිවට්) ලිමිටඩ්.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

සමාගම් ලේකම්,
ෆේවරිට් ගාමන්ට්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්.

06-421

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.